කුරුණෑගල මහා නගර සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ III ශ්‍රේණියේ රියදුරු (විවෘත) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

1. කුරුණෑගල මහා නගර සභාවේ පවතින ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ රියදුරු තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු 09 ක් සඳහා බඳවා ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පදිංචි බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාවය තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් අදාළ පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3. කුරුණෑගල මහා නගර සභාවේ රියදුරු පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

(***සංලක්ෂ්‍යය .-*** මෙම බඳවා ගැනීම කුරුණෑගල මහා නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සත අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු වලට අදාළව රියදුරු රාජකාරි ඉලක්ක කරගෙන සිදු කරනු ලැබේ.)

4. වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 10/2025 අනුව මාසික වැටුප් පරිමාණය PL 3 - 2025 - රු. 42,780 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540 වේ.

5. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය සේවකයින් සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔවුන් යටත් විය යුතුවේ.

6. තව ද ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට නිලධාරීන් විසින් ඒ මුදල් ගෙවිය යුතුය.

7. ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ රියදුරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් අදාළ වේ..

(අ) **අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො. ස (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 6 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වරකදී විෂයයන් 5ක් සමත් විය යුතුය.

(ආ) **වෘත්තීය සුදුසුකම් :**

i. ශිල්පීය නිපුණතා : තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රෙලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රය)

ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

(ඇ) **පළපුරුද්ද :**

වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.)

(ඈ) **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුය.

iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථීර පදිංචිය සනාථ කළ යුතු වේ.

iv. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

v. ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදු කරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.

vi. යම් අපරාධ නීති කෘත්‍යකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 449 වන වගන්තිය ප්‍රකාරව අධිකරණයකදී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.

(ඊ) **වයස් සීමාව :**

වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

8. **බඳවා ගැනීමේ ක්‍රමය :**

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තනතුරට අදාළ වන පරිදි වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලබන අතර තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය හා බඳවා ගන්නා සංඛ්‍යාව පිළිබඳ අවසන් තීරණය කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

9. සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ නිර්නායකයන් :

- **මූලික අධ්‍යාපන සුදුසුකම් :**

I.	අ.පො.ස. (සා.පෙළ) සාමාන්‍ය සාමාර්ථයක් සඳහා	ලකුණු 05
II.	අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා	ලකුණු 08
III.	අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා	ලකුණු 10

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ උපරිම වශයෙන් විෂයයන් 05 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. ඒ අනුව ලැබෙන උපරිම ලකුණු සංඛ්‍යාව — ලකුණු 50

- **වෘත්තීය සුදුසුකම් සඳහා :**

I.	තනතුරට අදාළ වන ශිල්පීය දැනුම (න්‍යායාත්මකව)	ලකුණු 25	
II.	තනතුරට අදාළ වන ශිල්පීය දැනුම (ප්‍රායෝගික)	ලකුණු 25	
	වෘත්තීය සුදුසුකම් සඳහා උපරිම ලකුණු සංඛ්‍යාව		ලකුණු 50
	මුළු ලකුණු සංඛ්‍යාව		ලකුණු 100

10. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**

මේ සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් සකස් කළ අයදුම්පත 2026.11.13 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑල මගින් නාගරික කොමසාරිස්, මහා නගර සභාව, කුරුණෑගල යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ලිපි කවරයේ වම්පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

11. අයදුම්පත සමඟ එවිය යුතු ලේඛන:

පහත ලේඛනවල තමා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

I. උප්පැන්න සහතිකය;
II. ජාතික හැඳුනුම්පත;
III. රියදුරු බලපත්‍රය;
IV. අධ්‍යාපන සහතික;
V. පදිංචි සහතිකය;
VI. වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතික.

12. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍ර යේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13. නියමිත වයස් සීමාවට අයත් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම අයදුම්පත් ලද බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

ඩබ්. එම්. පී. ජී. වීරසිංහ,
නාගරික කොමසාරිස්,

2026 ඔක්තෝබර් මස 30 වැනි දින,
මහා නගර සභාව,
කුරුණෑගල.